# දැන්වීමයි

## ශ්‍රම මිලදී ගැනීමේ පදනමින් පෙර පාසල් ගුරු තනතුර සඳහා බඳවා ගැනීම

## දොම්පෙ ප්‍රාදේශීය සභාව

දොම්පෙ ප්‍රාදේශීය සභාව මගින් අලුතින් ආරම්භ කිරීමට නියමිත කැරගල නිදහස් පෙර පාසලේ පෙර පාසල් ගුරු තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම්** :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

**වෘත්තීය සුදුසුකම්** :- පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජයේ පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06කට නො අඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

**වෙනත් සුදුසුකම්** :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.
iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

**කොන්දේසි** :-

i. මෙය දෛනික පදනමින් බඳවාගනු ලැබීමක් වන අතර, ඉදිරියේ දී ස්ථිර පදනමින් බඳවාගැනීමට හේතුවක් නොවනු ඇත.
ii. සේවා අවශ්‍යතාව මත සේවයේ යෙදවීමක් වන බැවින් කලින් දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ හැකියාව දොම්පෙ ප්‍රාදේශීය සභා ලේකම් සතුය.
iii. සේවය කරන මාසය සඳහා වැටුප ඊළඟ මස 10 වන දිනට ගෙවීම් කරනු ලැබේ.

**<u>බඳවා ගැනීමේ ක්‍රමය</u>** :- මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් සිදුකරනු ලබන අතර, ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

**<u>අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය</u>** :-

1) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පතක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "පෙර පාසල් ගුරු තනතුර සඳහා බඳවාගැනීම" ලෙස සඳහන් කර 2025.02.15 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, දොම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිඳිවැල. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.
3) තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිවීමෙන් ආපසු හරවා යැවුනු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4) අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට එම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.
    a. උප්පැන්න සහතිකය
    b. අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික
    c. වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික
    d. පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය
    e. ජාතික හැඳුනුම්පත

ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී
දොම්පෙ ප්‍රාදේශීය සභාව.
2025.01.28